



# English සිංහලෙන් online ඉගෙන ගන්න ingrisi.com




අන්තර්ජාලයේ මොනවද නැත්තේ.. නෑ හැම දේම තියෙනවා..

කාලයක් මතයක් තිබුණා අන්තර්ජාලයේ සැරිසරන්න ඉංග්‍රීසි දැනගෙන ඉන්න ඕනෙ කියලා..

අනේ එහෙම නෑ.. අන්තර්ජාලයෙන්ම online ඉංග්‍රීසි ඉගෙන ගන්න පහසුකම් තියෙද්දී එහෙම කියන්නෙ කොහොමද.?

දැන් එක තවත් පහසු කරමින් සිංහලෙන් English ඉගෙන ගන්න පුලුවන් අපූර්ව වෙබ් අඩවියක් තියෙනවා.. ingrisi.com කියලා.

මේක කරන්නේ අනුර සපරමාදු මහත්මයා. ඔහු භාෂා ගනනාවක ප්‍රවීණයෙක්. ඔහු හෙළයේ මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් ගේ මුණුපුරා කියලත් අපිට දැනගන්න ලැබුණා.

පසුගියදා අපි ඔහුව මුණ ගැහුණා මේ වෙබ් අඩවිය ගැන කතා කරන්න..

### ලංකාවේ ඉංග්‍රීසි ඉගැන්වීම සහ ඉගෙන ගැනීම කොහොම එකක්ද?

ලංකාවේ සියයට එකහාමාරයි ඉංග්‍රීසි හොඳට කතා කරන්න පුළුවන් අය ඉන්නේ. ඒක තමයි ලංකාවේ තියෙන ලොකුම ප්‍රශ්නෙ. අනිත් ප්‍රශ්නෙ තමයි තමයි උගන්නන්න ගුරුවරු නොමැති කම.

ලංකාවේ සුදුසුකම් තියෙන ගුරුවරයෙක් ඉන්නවනම් එයාට රුපියල් දහ පහොලෙස් දහකට පාසලේ උගන්වන්න අවශ්‍ය නැහැ. වෙනත් ආයතනයක ඒ වගේ තුන් හතර ගුණයක මුදලකට වැඩ කරන්න පුළුවන්.

මම හොඳම උදාහරණයක් කියන්නම්, ටියුෂන් පන්ති වල ඉන්න ටීචර්ස්ලා අපේ PDF lessons download කරලා ඒවා photocopy කරලා ළමයින්ට දෙනවා. ඒ අයම අපිට ඒක කියනවා. ඉතින් මෙහෙම තත්ත්වයක් තමයි ලංකාවේ තියෙන්නේ.

### අපි ඉංග්‍රීසි ඉගෙන ගන්න විදිහ හරිද?

මම හිතන්නේ ඒක වැරදියි. හැබැයි මේකට තියෙන ලොකු ප්‍රශ්නෙ තමයි මම කලිනුත් කිව්වා වගේ පාසලේ උගන්නන්න ගුරුවරු නොමැති කම. O/L වලට සම්මානයක් තියෙනවනම් English වලින් එයාට පුළුවන් English teacher කෙනෙක් වෙන්න.

ඉතින් ඒ අයට ඉංග්‍රීසි කතා කරන්න බැහැ. මෙහෙම හිතන්න මට දෙමළ කතා කරන්න බැරුව මට දෙමළ උගන්වන්න බැහැනේ. අන්න ඒ වගේ ඉංග්‍රීසි කතා කරන්න බැරුව ඉංග්‍රීසි උගන්වන්න බැහැ.

මම ඒකට උදාහරණයක් කියන්නම්. අපි ගියා යාපනේට. එවෙලාවේ අපිට කෙනෙක් කිව්වා. ඉංග්‍රීසි උගන්වන්න හිටපු teacher O/L ඉංග්‍රීසි අසමත්. ඒත් අද එයා ඒ පාසලේ ඉංග්‍රීසි ගුරුවරයෙක්. සුදුසුකමක් නොමැති ගුරුවරු නිසාත් මේ ප්‍රශ්නේ වෙනවා. අනික ඉතින් සුදුසුකම් තියෙන අයට ගුරුවරු වෙන්න අවශ්‍ය නැහැ.



### ඉගෙන ගන්න තියෙන හොඳම විදිය මොකක් කියලද ඔබ හිතන්නේ?

පොතකින් විතරක් ඉංග්‍රීසි ඉංගන ගන්න බැහැ. ඒක එතකොට හරි අමාරු වැඩක්. ඉංග්‍රීසි කතා කරන්නේ කොහොමද ශබ්ද වෙන්නේ කොහොමද කියලා ඒකට නිතර ඇහුකම් දෙන්න ඕන.

ටියුෂන් පන්ති වල ඕක කරන්න බැහැනේ. ගුරුවරයා බෝඩ් එකේ ඔක්කොම ලියලා මයික් වලින් කතා කරනවා. ඒවා බලන්න පහලින් TV දාලා තියෙනවා. ඊට පස්සේ ළමයි ඔක්කොම ගෙදර යනවා. ඉගෙන ගන්නවනම් හොඳට අහුකම් දිය යුතුයි.

### හරි එහෙමනම් මට කියන්න ingrisi.com හි ඉගැන්වීම විශේෂ වෙන්නේ කොහොමද?

අපි ඉදිරිපත් කරන්නේ පොතේ තියෙන grammar විතරක් නෙමෙයි. අපේ lessons තියෙනවා අතිරේක පාඩම් කියලා. ඒ dictation තියෙනවා. එතකොට ගීත අහන්න. මේ වගේ ගොඩාක් දේවල් තුළින් හැදෑරීම් කරන්න පුළුවන් කම තියෙනවා. මෙහෙමයි අපි මොන මොන දේවල් දුන්නත් වැඩක් නැහැ. භාෂාව ඉගෙන ගන්න කෙනාටත් ඒ සඳහා උවමනාව තිබිය යුතුයි.

අපි ඉංග්‍රීසි උගන්වන්නේ ලංකාවේ අයට විතරක් කියන එක තේරෙන්න, ෆොරිනර්ස්ලාගේ ඒවා නොතේරෙන විදිහට නෙමෙයි. එක එක රටවලට යනකොට pronunciation වල accent එක වෙනස්. ඉතින් ingreesi.com එක හරහා විවිධ pronunciation අහන්න පුළුවන් කම තියෙනවා.

### ඇත්තටම අන්තර් ජාලය හරහා ඒ කියන්නේ Online ඉංග්‍රීසි ඉගෙන ගන්න පුළුවන්ද?

මම ඒකට උදාහරණයක් කියන්නම්. අපිට ආවා සබරගමුවක බැංකුව වැඩ කරන මහත්මයෙක්ගෙන් email එකක්. ඒ පුද්ගලයා පළවෙනි ලෙවල් එක සමත්. මට දෙවැනි ලෙවල් එකට යන්න පුළුවන්ද කියලා English වලින් email කරලා තිබුණා. හිතන්න ඉංග්‍රීසි වචනයක් ලියගන්න බැරිව හිටපු මනුස්සයා English වලින් email කරනවා. මෙහෙමයි. අපිට භාෂාවක් ඉගෙන ගන්න ඕන හැම දැනුමක්ම දෙන්න පුළුවන්. ඉගෙන ගන්න කෙනාටත් ඒකට උවමනාව තියෙන්න ඕන. නැත්නම් මේක කරන්න බැහැ.

### ඉංග්‍රීසි ඉගෙන ගන්න තියෙන තාක්ෂණික ක්‍රමවේදය මොකක්ද?

60 දශකයේ හිතන් හිටියේ මිනිස්සු ඉංග්‍රීසි උගන්වන්න ඕන ඉංග්‍රීසියෙන්මයි කියලා. ඒක එහෙම නෙමෙයි. යුරෝපයේ රටවල ඉංග්‍රීසි උගන්වන්නේ ඒ ඒ රටවල භාෂාවෙන්. උදාහරණයක් විදිහට අපි කිව්වොත් මේක අතීත කාලයෙන් ලියන්නේ මෙහෙමයි කියලා ඒක තේරෙනවා. අපි අපේ Courses හදලා තියෙන්නෙත් අන්න ඒ විදිහට.

අපි ඉංග්‍රීසි උගන්වන්නේ සිංහලෙන්. හැබැයි අපි advance level එකට එනකොට අපි අපේ පාඩම් කරන්නේ ඉංග්‍රීසියෙන්මයි.

### හරි අවසාන වශයෙන් ingrisi.com වලට දෙන්න පුළුවන් සහතිකය මොකක්ද?

අපිට කොළඹ විශ්ව විද්‍යාලයේ අනුමැතිය වගේම විවෘත විශ්ව විද්‍යාලයේ අනුමැතියත් ලැබිලා තියෙනවා. ඒ වගේම තවත් ගොඩාක් ආයතන අපිත් එක්ක වැඩ කරන්න මේ වෙනකොට අත්වැල් බැඳගෙන තියෙනවා. ඒකම තමයි අපේ සහතිකය.

සටහන - හිමාෂි, රන්මි

ඡායාරූප - හර්ෂණී පෙරේරා




